Department of Education,Sabaragamuwa Province/ Weekly School

## පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

## සති පාසල

**විෂය- පෙරදිග සංගීතය**

**ජූනි මාසය - 01 සතිය**

**ශ්‍රේණිය - 9**

**සැකසුම - ඩබ්.එන්.ජී.චන්ද්‍රකාන්ති**

**ර/ නිවි/ ඇලපාත මහා විද්‍යාලය**

**නිපුණතාව 1.0 - සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 1 .1 - ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.**

**ක්‍රියාකාරකම 1.1.1 - භූපාලි රාගයට අයත් රාගාංග ඇතුළත් කෙටි ස්වර ඛණ්ඩ ගායනය**

**ඉහත 1.1.1 ක්‍රියාකාරකමට අදාළ ව සපයා ඇති අංක 01, 02, 03 පැවරුම් සම්පූර්ණ කරන්න.**

<u>පැවරුම- 01</u>

1. භූපාලි රාගයට අයත් පහත සඳහන් සර්ගමය හොඳින් නිරීක්ෂණය කරන්න. විශේෂයෙන් යටින් ඉරි ඇඳි ස්වර කොටස් පිළිබඳ ඔබේ අවධානය යොමු විය යුතු වන අතර ඒවා භූපාලි රාගයට අයත් ප්‍රධාන රාග අංග වේ.

| | | | |
|---|---|---|---|
| 0<br>ස˚ ස˚ ධ ප<br>ග ප ධ ස˚ | 3<br>ග රි ස රි<br>රි˚ ස˚ ධ ප | x<br>ග - ප ග<br>ස˚ ප ධ ප | 2<br>ධ ප ග -<br>ග රි ස - |
| ග ග ප ධ<br>ග˚ ග˚ රි˚ ස˚ | ප ස˚ - ස˚<br>රි රි ස˚ ධ | ධ ධ ස˚ රි˚<br>ස˚ ස˚ ධ ප | ග˚ රි˚ ස˚ ධ<br>ග රි ස - |

11. භූපාලි රාග විස්තර සහිත රාගාංග ගායනයක් පහත සබැඳිය හරහා ඔබට ශ්‍රවණය කළ හැකිය.

❖ https://youtu.be/GNj04eXtcDA

111. භූපාලි රාගයට අයත් පහත ස්වර ඛණ්ඩ නිවැරදි ව ඔබේ අභ්‍යාස පොතේ සටහන් කරගන්න.

**(සධ,සරිග/සරි ගපග,ධපග/ගප,ධස˚/ගරි,**සරිස,ධරිස/සරිග,**රිග,පරිස/ගප,ධරි˚ස˚/ගග පධස˚/ගරි සධස)**

<u>පැවරුම- 02 ලිඛිත</u>

1. භූපාලි රාගයට අයත් රාගාංග ඇතුළත් ස්වර ඛණ්ඩ භාවිත කරමින් සුදුසු තාලයකට අනුව ස්වර පේළි දෙකක් හෝ හතරක් නිර්මාණය කර, ඊට ගැළපෙන ගී පාදයක් නිර්මාණය කරන්න.

<u>පැවරුම - 03</u>

1. අන්තර්ජාලයෙන් .භූපාලි රාගයට අයත් ශාස්ත්‍රීය ගායන/වාදන පරිශීලනයට යොමු වන්න.